කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව I , II | කාලය පැය 03

නම : ........................................................................................................

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරෙන් 1 සිට 06 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A
වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ

B
යක් දෙස්සා : හිරි වැද්දා කදිම වැද්දා ඒ උනාට මොකද?
උඹ බණ්ඩාර වැද්දා මු මොකාද මෙතන මෙහෙම බලන් ඉන්නේ?

C
ජටා හිස දරමිණ - සුද්ද අෂ්ටක වැල්ද කරලන
කුඩය ගෙන සුරතින - මෙසේ බමුණෙක් සබේ නික්මුණ

D
ගුරු - නානු ගා ගත්තනම් නාන්න එපැයැ ඔහෝම ඉන්න පුළුවන්නැයි ?
ගැ.වෙ. අදුරා : නාන්නෙ කොහෙන්ද?

E
නැත පියාණෙනි කිසිදු මනදොල
සමා වුව මැන දොසක් වී නම්
වෙසෙන සඳ මේ පාළු ලෙන තුල
නෙක් දිසා සිත පියාඹා යයි

01. කොහොඹා කංකාරි ශාන්ති කර්මයට අයත් නාට්‍යමය අවස්ථාවක් ඇතුලත් වන්නේ,
1. A අවස්ථාවේදීය 2. B අවස්ථාවේදීය 3. C අවස්ථාවේදීය 4. D අවස්ථාවේදීය

02. D අවස්ථාවෙන් නිරූපණය වන නාට්‍යමය අවස්ථාව ඇතුලත් වන ශාන්ති කර්මය,
1. කොහොඹා කංකාරිය 2. දෙවොල් මඩුව 3. රට යකුම 4. සුනියම් යාගය

03. පහතරට ගැමි නාටකයට අයත් අවස්ථාවක් ඉදිරිපත් වී ඇත්තේ,
1. A අවස්ථාවේදීය 2. B අවස්ථාවේදීය 3. D අවස්ථාවේදීය 4. E අවස්ථාවේදීය

04. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ශෛලිගත නාට්‍යකට අයත් අවස්ථාවක් සඳහන් ව ඇත්තේ,
1. B අවස්ථාවේදීය 2. C අවස්ථාවේදීය 3. E අවස්ථාවේදීය 4. D අවස්ථාවේදීය

05. සුනියම් ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථාවක් ඇතුලත් ඇත්තේ,
1. E අවස්ථාවේදීය 2. D අවස්ථාවේදීය 3. C අවස්ථාවේදීය 4. A අවස්ථාවේදීය

06. පහතරට ශාන්ති කර්මයක් ඇතුලත් "දොළහ පෙළපාලිය" අවස්ථාවන්ට අයත්වන අවස්ථාව සඳහන් ඇත්තේ,
1. A අවස්ථාවේදීය 2. B අවස්ථාවේදීය 3. C අවස්ථාවේදීය 4. D අවස්ථාවේදීය

නිවැරදි පිළිතුර තෝරන්න

07. පහත සඳහන් කලා අතුරෙන් ප්‍රාසාංගික කලා ගණයට ගැනෙන්නේ,
1. සංගීත සන්දර්ශන , නර්තන සංදර්ශන, මුද්‍රා නාට්‍ය සහ ඔපේරා
2. සංගීත සංදර්ශන, වේදිකා නාට්‍ය, මූර්ති ඇඹීම, සහ ගීත නාට්‍යය
3. මුද්‍රා නාට්‍ය සාහිත්‍ය ග්‍රන්ථ, වේදිකා නාට්‍ය සහ නර්තන සංදර්ශනය
4. රූකඩ , බලි ශාන්තිකර්ම, චිත්‍ර ප්‍රදර්ශන සහ චිත්‍රපට

08. නාට්‍යෝපකරණ යනුවෙන් හැඳින්වෙන්නේ,
1. වේදිකා සැරසිලිය
2. නළුවන්ගේ වේෂරූපණය
3. වේදිකා ආලෝක පහන්ය
4. නළුවන් රංගනය සඳහා භාවිත විවිධ තත්ත්ව

09. පහත දැක්වෙන රංගෝපක්‍රම අතුරෙන් නාට්‍යධර්මී නොවන්නේ කුමක්ද?
1. ආත්ම භාෂණ කථන ක්‍රමය
2. ස්භාවික සංවාද භාවිතය
3. නාට්‍යයට නළුවෙකු යොදා ගැනීම
4. පරිශ්‍රමණය යොදා ගැනීම

10. නළුවෙකුට දෙබස් උච්චාරණය කිරීමේ ශක්තිය වර්ධනය කර ගැනීමට ඉවහල් වන රංග අභ්‍යාස වර්ගය වනුයේ,
1. ශ්වසන අභ්‍යාස
2. ශිථිලීකරණ අභ්‍යාස
3. රිද්මයානුකූල අභ්‍යාස
4. දර්පණ අභ්‍යාස

11. වාචිකාභිනය යොදා ගනු ලබන්නේ පහත දැක්වෙන කවර ප්‍රාසාංගික අංගයේද?
1. මුද්‍රා නාට්‍යයේ
2. ඔපෙරා
3. පන්තේරු නැටුම
4. අභිරූපණය

12. නාට්‍ය කෘතියක් සිනමා කෘතියකින් වෙනස් වන්නේ පහත දැක්වෙන කවර කරුණු හේතුකොට ගෙනද?
1. එය ජීවිතයේ අනුකරණයක් වන නිසා
2. එය ප්‍රේක්ෂක උදෙසා නිර්මාණය වූ නිසා
3. එය සජීවී කලා නිර්මාණයක් වන නිසා
4. ඒ සඳහා පක්ෂ වූ විශේෂ ස්ථානයකට ගොස් නැරඹිය හැකි නිසා

13. උරුට්ටුව නම් සංගීත ඛණ්ඩය යොදනු ලබන්නේ,
1. සොකරි ගැමි නාට්‍යයේ
2. කෝලම් ගැමි නාට්‍යයේ
3. නාඩගම් නාට්‍යයේ
4. නූර්ති නාට්‍යයේ

14. සොකරි නාට්‍යයකට අදාල නොවන්නේ පහත සඳහන් කවර ලක්ෂණයක්ද?
1. පත්තිනි පූජාව මුල් කරගෙන පැවැත්වීම
2. සශ්‍රීකත්වය අරභයා පැවැත්වෙන්නක් වීම
3. පිරිමි පමණක් චරිත නිරූපණය කිරීම
4. ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම රඟපානු ලැබීම

15. පහත සඳහන් නාට්‍ය අතුරින් ස්වතන්ත්‍ර නාට්‍යයක් නොවන්නේ කුමක්ද?
1. නරිබෑණා
2. හුණුවටයේ කතාව
3. දෙවෙනි මහින්ද
4. ස්වර්ණමාලි

16. සරත්චන්ද්‍ර මහතාගේ "සිංහබාහු" නාට්‍යයට පදනම් වී ඇත්තේ මින් කුමක්ද?
1. ජන කථාවක්
2. ජාතක කථාවක්
3. අරුණෝක්තියක්
4. විදේශ ජන කථාවක්

17. "කාචයක් සහිත වූ මෙම පහන ලොකු කුඩා වශයෙන්ද තියුණු හා මඳ වශයෙන් ද ආලෝක ලපයක් ලෙසින් ද ආලෝකය නිකුත් කරයි" මෙම පහන හැඳින්වෙන නම වන්නේ,
1. බාරාලෝක පහන
2. අල්ට්‍රා වයලට් පහන
3. වැටින් ලාම්පු
4. යොමු පහන

18. නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීත අයත්වන අභිනය

1. වාචික අභිනය හා ආහාර්ය අභිනයයි
2. සාත්වික අභිනය හා ආංගික අභිනය
3. වාචික අභිනය හා සාත්වික අභිනය
4. ආහාර්ය අභිනය හා වාචික අභිනය

19. නාට්‍යයක් ඉදිරිපත් කරන ශෛලිය හා අනුගත නොවන සාධකය වන්නේ මින් කුමක්ද?

1. සංවාද
2. රංගාලෝකය
3. සංගීතය
4. අංග රචනය

20. කටහඬ හා වචන උච්චාරණ පුහුණුව සඳහා වඩාත් යෝග්‍ය ග්‍රන්ථ වන්නේ,

1. නම් පොත බුද්ධ ගජ්ජය හා මහාවංශය
2. ගණදෙවි හැල්ල ගුත්තිල කාව්‍ය හා බුද්ධ ගජ්ජය
3. බුද්ධ ගජ්ජය සකස්කඩ හා මහාවංශයයි
4. සකස්කඩ , බුද්ධ ගජ්ජය හා නම් පොතයි

21. ශාන්තිකර්ම වල නාට්‍යමය පෙලපාළි පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. හුදු විනෝදාස්වාදය ලැබීමට පරමාර්ථ වුවකි
2. නාට්‍ය කලාවේ මූලාරම්භ අවස්ථාවකි
3. අන්තර් රංග අවස්ථාවක් ලෙසද හඳුන්වයි
4. නාට්‍යමය ලක්ෂණ පැහැදිලිව ඇතුලත්ව ඇත

22. සිංහලෙන් රචනා වූ ප්‍රථම නාඩගම ලෙස සැලකෙන්නේ,

1. ඉයුජින් නාඩගම
2. කාලගෝල නාඩගම
3. ඇහැලේපොල නාඩගම
4. බැලසන්ත නාඩගම

23. ලෝක ප්‍රකට හංසවිල නාට්‍ය අයත් වන්නේ කුමන නාට්‍ය ගණයටද?

1. බැලේ
2. ඔපෙරා
3. ගීත නාට්‍ය
4. සංවාද නාට්‍ය

24. ටවර් හෝල් රඟහලේ පෙන්වන ලද ප්‍රථම නූර්ති නාට්‍ය වන්නේ,

1. සිරිසඟ බෝ
2. සකුන්තලා
3. වෙස්සන්තර
4. පණ්ඩුකාභය

25. "මිනර්වා නාට්‍ය කණ්ඩායම" අයත් වූයේ,

1. චාල්ස් ඩයස්ට
2. ජෝන් ද සිල්වාට
3. සිරිසේන විමලවීරට
4. ඩබ්ලිව් ජයමාන්නට

26. කුවේණි, ජනේලය, අපට පුතේ මගක් නැතේ යන නාට්‍ය රචනා කරමින් නිෂ්පාදනය කර ඇත්තේ,

1. ආර් ආර් සමරකෝන්
2. දයානන්ද ගුණවර්ධන
3. හෙන්රි ජයසේන
4. ගුණසේන ගලප්පත්ති

27. බෝඩිං කාරයෝ , හරිම බඩු හයක් හා දුන්න දුනු ගමුවේ ආදි නාට්‍ය නිෂ්පාදනය කල නාට්‍ය කරුවන්නේ,

1. සුගතපාල ද සිල්වා
2. දයානන්ද ගුණවර්ධන
3. සයිමන් නවගත්තේගම
4. ආර් ආර් සමරකෝන්

28. නාට්‍ය පසුතල නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු වන්නේ,

1. පසුතල වලින් ප්‍රේක්ෂක ආකර්ශණය දිනා ගැනීම
2. අධික වියදම් නොදැරීම හා කාලයක් පැවතීම
3. නළු කාර්යය පහසු කිරීම
4. අලංකරණයක් ලෙස යොදා ගැනීම

29. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ,

1. යථාර්ථය වූ ලෙසටම වේදිකාවේ ඉදිරිපත් කිරීමයි
2. ස්වභාවික තත්ත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාවේ ඉදිරිපත් කිරීමයි
3. අතිශයෝක්තියට නගා රූපණය ඉදිරිපත් කිරීමයි
4. චලන රටා හා වේදිකා අලංකරණ අතිශයෝක්ති වීමයි

30. නළු නිළියන් වේදිකා අවකාශයේ චලන රටා ඇති කරවීම

1. අංග රචනයයි 2. නර්තන රචනයයි 3. වේදිකා රචනයයි 4. රංග රචනයයි

31. "නෘත්‍යය" සඳහා අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

1. නර්තකයා අංග ප්‍රත්‍යාංග හා උපාංග උපයෝගී කරගෙන නර්තනය කරයි
2. නර්තකයා ගීත ගයමින් නර්තනයේ යෙදේ
3. විචිත්‍රවත් වූ ඇඳුම් පැළඳුම් භාවිතා කෙරේ
4. නර්තනය මගින් යම් අදහසක් කියා පායි

32. ක්‍රේප් හෙයා , ස්ටිප් ගම් , පදනම් ආලේපන ආදි ද්‍රව්‍ය උපයෝගී කරගනු ලබන්නේ,

1. රංගාලෝකය නිර්මාණයේදී 2. රංග භාණ්ඩ නිර්මාණයේදී
3. පසුතල නිර්මාණ සකස් කිරීමේදී 4. අංගරචනය කිරීමේදී

ප්‍රශ්න අංක 33 සිට 37 දක්වා පිළිතුරු සැපයීමේදී පහත තොරතුරු ඇසුරු කර ගන්න.

| නාට්‍යයේ නම | රචකයා | මෙරට නිෂ්පාදනයේ නම | මෙරට නිෂ්පාදනය |
|---|---|---|---|
| ඉක්නෙවිටායි | සොෆොක්ලීස් | බෙරහඬ | A |
| දග්ලාස් මෙනාජරි | B | අහස් මාලිගා | හෙන්රි ජයසේන |
| C | ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව් | පුතු සමාගම | ප්‍රසන්න විතානගේ |
| ද පබ්ලික් එනිමි | D | ජන හතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| එව්රිමැන් | හියුගෝෆෝන් | E | බන්දුල ජයවර්ධන |

33. වගුවේ A ස්ථානයට අයත් විය යුතු නාමය වන්නේ,

1. බන්දුල ජයවර්ධන 2. හෙන්රි ජයසේන 3. සුනන්ද මහේන්ද්‍ර 4. සුගතපාල ද සිල්වා

34. වගුවේ B ස්ථානයට අයත් විය යුතු නාමය වන්නේ,

1. නිකොලායි ගොගොල් 2. හෙන්රි ඉබ්සන් 3. ටෙනසි විලියම්ස් 4. ඇන්ටන් චෙකොෆ්

35. වගුවේ C ස්ථානයට අයත් විය යුතු නාමය වන්නේ,

1. ද ෆාදර් 2. දී එල්ඩර් සන් 3. දමැරේජ් 4. රූඩන්ස්

36. වගුවේ D ස්ථානයට අයත් විය යුතු නාමය වන්නේ,

1. හෙන්රික් ඉබ්සන් 2. විලියම් ශේක්ස්පියර් 3. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් 4. ඇන්ටන් චෙකෝෆ්

37. වගුවේ E ස්ථානයට අයත් විය යුතු නාමය වන්නේ,

1. මකරාක්ෂයා 2. ගොඩෝ එනකං 3. වෙස් මුහුණු 4. සකල ජන

38. ලග්ගල , කළුන්දව, තලාතුඔය , මීරුප්පේ ආදි ප්‍රදේශවල වඩාත් ප්‍රචලිත ගැමි නාට්‍යය වන්නේ,

1. සොකරි 2. කෝලම් 3. නාඩගම් 4. කුත්තු

39. හිම කන්දක් සේ දියවී යාම" නැමති රංග අභ්‍යාසය අයත් වන්නේ,

1. ස්වසන අභ්‍යාස 2. ශිථිලකරණ අභ්‍යාස 3. රිද්ම අභ්‍යාස 4. කටහඬ අභ්‍යාස

40. අංග රචනය බෙදෙනු ලබන ප්‍රධාන ප්‍රභේද ගණන

1. 4 යි 2. 2 යි 3. 3 යි 4. 6 යි

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්ණ 4කට පිළිතුරු සපයන්න.

01. 1. විකෘති නාට්‍යයේ අධ්‍යක්ෂක වරයා නම් කරන්න (2)
 2. එම අධ්‍යක්ෂක වරයා විසින් නිර්මාණය කරන ලද වෙනත් නාට්‍යයක් නම් කරන්න. (2)
 3. විකෘති නාට්‍යයේ එන චරිත 4 ක් නම් කරන්න (2)
 4. විකෘති නාට්‍ය ඉදිරිපත් කරන නාට්‍ය ශෛලිය නම් කරන්න (2)
 5. නාට්‍යයේ ප්‍රභල ලෙස ගැටුම් අවස්ථාවන් ගොඩ නැගෙනුයේ කවර චරිතයන් වටාද? (2)
 6. නාට්‍යයේ තේමාව කෙටියෙන් සඳහන් කරන්න. (2)

02. 1. පහතරට සම්ප්‍රදායේ ගැමි නාට්‍යය නම් කරන්න (2)
 2. එම ගැමි නාට්‍යය ප්‍රචලිත ප්‍රදේශ 4ක් නම් කරන්න (4)
 3. එහි රංග ශෛලියේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න (6)

03. 1. "රංගාලෝකය" යන්න හඳුන්වන්න (2)
 2. රංගාලෝකය සිදු කිරීම සඳහා යොදා ගනු ලබන ප්‍රධාන ආලෝක පහන් වර්ග 2 නම් කරන්න. (4)
 3. වේදිකා නාට්‍යයට රංගාලෝකය මගින් ලබාගත හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න (6)

04. 1. නූතනයේ භාවිතා වන රංග භූමි වර්ග 4ක් නම් කරන්න. (4) (2)
 2. රංග භූමියක පැවතිය යුතු මූලික අවශ්‍යතා මොනවාද? (4)
 3. රංග භූමියේ විකාශනය පිලිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (6)

05. 1. නාඩගම් නාට්‍ය කලාව ආරම්භය පිළිබඳව ඇති මතවාදයක් ලියන්න. (2)
 2. නාඩගම් නාට්‍ය කරුවන් දෙදෙනෙකු නම් කර ඔවුන් විසින් නිෂ්පාදනය කරන ලද නාඩගම් නාට්‍ය එක බැගින් සඳහන් කරන්න. (4)
 3. ලංකාවේ නාඩගම් නාට්‍ය බිඳ වැටීමට තුඩුදුන් හේතු කවරේදැයි පැහැදිලි කරන්න. (6)

06. 1. පහතරට සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය නම් කරන්න. (2)
 2. එම ශාන්ති කර්මයෙහි ඇතුලත් අන්තර් රංග අවස්ථා 4ක් නම් කරන්න (4)
 3. අන්තර් රංග අවස්ථාවක ඇතුලත් නාට්‍යමය ලක්ෂණ මොනවාදැයි පෙන්වා දෙමින් පැහැදිලි කරන්න (6)

07. පහත සඳහන් කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙලක් රචනා කරන්න. පොහොසත් නිවසක මෙහෙකාරියක වන සුජාතා ඉතා ප්‍රසන්න තැනැත්තියකි. ඇයට දිගු වරලස ආභරණයක් වැනිය. නිවෙස් හිමි කාන්තාව ඈ කෙරෙහි දක්වන්නේ අප්‍රසන්න හැඟීමකි. ඇයගේ දරුවන් සුජාතාට ඉතා ලෙන්ගතුය. දිනක් දරුවන් සමඟ උඩු මහලේ සිටින සුජාතාට ........................ (12)